
ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 64678
LONDON NW3 9LS
ENGLAND

*Phone* : 020 74289388
*Fax* : 0871 9005163
E-mail : lanka.viththi @ virgin.net

*කර්තෘ* : දයා ආනන්ද රණසිංහ
*Editor* : Daya Ananda Ranasinghe
*චිත්‍ර* : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna
*පරිගණක කටයුතු* : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal
*ඡායාරූප* : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam



## අහා! යුද්ධ නැති නවවසරක් !

මින් පෙර හැම ජනවාරි මසකම අපේ ප්‍රාර්ථනාව වුයේ යුද්ධයක් නැති වසරක් උදාවේවා! යන්නයි. එහෙත් එය කිසි දිනක ඉටු නොවන ප්‍රාර්ථනාවක් බව එකල අපි කවුරුත් සිතුවෙමු. කොටි ත්‍රස්තවාදය සංසාරය මෙන් කෙළවරක් දැකිය නොහැකි මහා ව්‍යසනයක් විය. අපේ රට එකම කඳුළු ගඟක් විය. අපට අවශ්‍ය එකමුතුකම නැති නිසා ම්ලේච්ඡ ත්‍රස්තවාදී සතුරන් හමුවේ අප අඩපණ වන අයුරු දැක අප නිරතුරු සිටියේ දැඩි ලෙස කම්පා වුණු සිතිනි. ඒ නිසා ලියූ හැම ලියවිල්ලකම, ඇන්ද හැම සිතුවමකම, ගැයූ හැම ගීතයකම, මැතිරූ හැම සෙත් පිරිතකම ගැබ්වුයේ අප රට ත්‍රස්තවාද ව්‍යසනයෙන් නිදහස්වේවා! යන ඒකායන ප්‍රාර්ථනාවයි. ඒ හැර වෙන කුමක් කරන්නද?

මෙසේ අරමුණක් නැතිව සිටින කල, අපේ රණවිරුවන්ගේ මහිමයෙන්, ඔවුන්ගේ ජීවිත පරිත්‍යාගයෙන්, අපේ නොව ඔවුන්ගේ නොපසුබට උත්සාහයෙන් වියඝීයෙන් අපේ ඒ සියළු ප්‍රාර්ථනාවන් ඉෂ්ට කරමින් අපේ දයාබර ලක්මාතාවට සැනසුම් සුසුමක් හෙලන්නට හැකි දිනයක් උදාවිය. ඒ පෞඩත්වයේ විශිෂ්ඨත්වය එකම සොම්නසක්, සිනා ගඟුලක් වී අපේ දේශය පුරා විහිදී විසිරී දෝරේ ගලා ගිය හැටි අපි සියැසින් දුටුවෙමු. අද මේ උදාවූ නව වසරේ වෙනදා මෙන් දුකෙන් සුසුමෙන් නොව සිතේ තවම දැඟලන ඒ නිදහස් නිවහල් ප්‍රීතියෙන් යුතුව බියෙන් සැකෙන් තොරව අද දවසේ අපේ රටේ ජනතාව එළියට පාරකට තොටකට බැස යනු දැක්මට වඩා තවත් ප්‍රීතියක් අපට නැත. මේ උත්තරීතර නිදහස ප්‍රීතිය යළි කිසි දිනක අප නැතිකර ගතයුතු නොවේ. මෙය කිසිසේත් පාවාදිය යුතු නොවේ. ඒ බව අප තදින් සිතට ගත යුතුය. නිතර සිහි කළ යුතුය.

මෑත ඉතිහාසයේ අපේ රටේ වූ භයානකම යුද්ධය පසුගිය මැයි 18 වනදා අවසාන විය. අවුරුදු 30 කට ආසන්න කාලයක් එය අපේ ජන ජීවිත, අපේ රටේ ධනය, දේපළ ආදී සියළු වටිනාකම් විනාශ කළාය. එය කිසිසේත් දිනන්නට බැරි යුද්ධයක් ලෙසත්, ශ්‍රීලංකාව පරිහානියට පත් දේශයක් ලෙසත් සලකා ඉතා **අවාසන්වන්ත රට** යන ලේබලය අලවා තිබිය දී නොසිතුවිරූ අන්දමින් ඒ කියුම් සියල්ලම මකා දමමින් ජයග්‍රාහීව හිසඔසවා, සිංහ ධජය යළි ගුවනේ ලෙළ දෙවන්නට අපේ විරුවන්ට හැකිවී ය. ඒ ජයග්‍රහණයේ වටිනාකම මුදලින් රනින් හෝ රිදියෙන් මිළකළ හැකි නොවේ.

ජයග්‍රහණයෙන් මාස හයක් ඉකුත්වූ අද මේ සිදුවන්නේ කුමක්ද? යුද්ධය කෙරීගෙන යන සමයේ පිටත හා අභ්‍යන්තර සතුරන්ගෙන් අඩුවක් නොවීය. දැන් ඒසතුරෝ යළිත් ඒක රාශිව අප විනාශකරන්නට වෙනත් වෙස් මුහුණක් පැළඳ ඇවිත් සිටිති. ඒ නම් හොඳකට නොවේ. සිංහලයා මෝඩයා යයි කියන කීම සැබෑවක් කරමින් සමහර සිංහලයින් සූදානම් වන්නේ මරන්නට දුවගෙන එන සතුරා බදාගෙන ඉඹින්නටය. තම අතින්ම ගෙල සිඳගන්නටය. එදාට යළිත් සිංහලයා බේරාගන්නට ජීවිතය දෙන්නට තව රණවිරුවන් ඒ රටෙහි ඉතිරිව නැති බව ඒ මෝඩ සිංහලයින් වටහා ගත යුතුය.

# ලක්වැසියන් ජීවමාන බුදුන් වහන්සේ දුටු දුරුතු මාසය

***ශාස්ත්‍රවේදි පණ්ඩිත***
***හොරණ පඤ්ඤාශේඛර මහා ස්ථවිරයන් වහන්සේ***



***මහියංගනයට දුරුතු පොහෝදා බුදුන්වහන්සේ වැඩම කර එහි දී යක්ෂ ගෝත්‍රිකයින් දමනය කළ බව දැක්වෙන කැළණි විහාරයේ චිත්‍රය***

මානව ඉතිහාසයේ ආරම්භය ගැන විමසන කෙනෙකුට පෙනෙන්නේ ඒ ආදි කාලයේ සෑම රටකම මුල් පදිංචිකරුවන් කලෑබද ප්‍රදේශවලත්, ගංගා නිම්න වලත් පදිංචිව සිටි නොදියුණු ගෝත්‍රික යන් ලෙස බෙදුණු, උනුනුන් හා සටන් කරන්නාවූ මිනිස් කොටසක් වූ බවයි.

ඒ සමාජ අතුරින් දියුණුව කරා ගමන් කළ පිරිස ආර්ය වශයෙනුත්, නොදියුණු පිරිස අනාර්ය වශයෙනුත් බෙදා දැක් වෙන බව ඓතිහාසික සාධක වලින් පෙනේ. ඒ අනුව පැරණි ලක්දිව විසූ මුල් පදිංචිකරුවන්ද යක්ෂ ගෝත්‍රික යන් හා නාග ගෝත්‍රිකයන් වශයෙන් විසූ බව පැහැදිලිය.

දීඝනිකායේ මහා පරිනිබ්බාන සූත්‍රයේ

පතිට්ඨස්සති දේවින්ද
ලංකායං මම සාසනං
තස්මා සපරිවාරං තං
රක්ඛ ලංකංච සාධුතං

යන ගාථාවෙන් සඳහන් වන්නේ පිරිනිවන් පෑමට පෙර තමා දැකීමට පැමිණි දේව බ්‍රහ්මයන් අතරෙහි සිටි ශක්‍ර දේවේන්ද්‍රයාහට බුදුන් වහන්සේ වදහළ දේශනයයි.

" දේවේන්ද්‍රය, මගේ ශාසනය ලංකාවේ ස්ථිර වශයෙන්ම පිහිටන්නේය. එහෙයින් විජය කුමරු ඇතුළු පිරිසද ලංකාවද ආරක්ෂාකර ගනුව " යනුයි.

ඒ අනුව ශක්‍රදේවේන්ද්‍රයා ලංකාවට පැමිණ පිරිත් පැන් ඉස යක්ෂ ගෝත්‍රිකයින්ගෙන් ලංකාව ආරක්ෂා කළ බව එම අටුවාවේ සඳහන්වෙයි. විජය ඇතුළු පිරිස ලංකාවට පැමිණියේද බුදුන් පිරිනිවන් පෑ දිනයේ යයි ද වැඩි දුරටත් සඳහන් වේ. මේ ප්‍රවෘත්ති යට අනුව බුදුන්වහන්සේ තමාගේ අනාගතංස ඥාණයෙන් ලංකාවේ අනාගතය දැක එකල ලක්දිව විසූ යක්ෂ නාග ගෝත්‍රිකයින්ගේ ආරවුල් විසඳීම සඳහා තෙවරක් ලක්දිවට වැඩම වූ බව අපේ වංශ කතාවල හා අටුවා ග්‍රන්ථවල දැක්වේ.

ඒ අනුව බුදුන්වහන්සේ බුද්ධත් වයට පත් පළමු වැනි වර්ෂයේ නවවැනි මාසයේ දුරුතු පුර පොහෝදා ප්‍රථම වරට යක්ෂ ගෝත්‍රිකයින් විසූ මහියංගනයේ මහානාග වනයට වැඩම කර ඔවුන්ට දම්දෙසූ සේක. ඒ දහම් අසා සමන්තකූට වාසී සුමන දෙවියන් සෝවාන් වූ බවත් ඔහුගේ ඉල්ලීම අනුව පුදපූජා කිරීම සඳහා කේශ ධාතු අටමිටක් දුන් බවත් සඳහන් වේ.

සුමන දෙවියන් ඒ ධාතු තැන්පත් කොට මහියංගනයේ බුදුන් වැඩි ස්ථානයේම සත්රියන් උස දාගැබක් බැඳ වීය. මෙය තමා විජයකුමාරයා ඇතුළු පිරිස ලක්දිවට පැමිණීමත් බුදු දහමපැමිණීමටත් පෙර බුදුහාමුදුරුවන් ජීවමාන කාලයේදීම ලංකාවේ ඉදිවුණ ප්‍රථම බෞද්ධ සංකේතය. සම් බුද්ධ පිරිනිර්වාණයෙන් පසුව සැරියුත් හිමියන්ගේ ශිෂ්‍යයෙකු වන සරභූ මහ රහතන් වහන්සේ බුදුන් ආදාහනය කළ තැනින් ලබාගත් ග්‍රීව ධාතුව රැගෙන ලක්දිවට පැමිණ මේ මහියංගන සෑයේම තැන්පත්කොට එය නැවත දොළොස් රියනක් උසට බැඳවූ සේක. පසුව වරින්වර චූලාභය රජු තිස්රියන් උසටද, දුටුගැමුණු රජු අසූරියන් උසටද මේ සෑය ප්‍රතිසංස්කරණය කළ බව අපේ වංශකතාවල සඳහන්වේ.

සිරිසඟබෝ කුමාරයා ඔහුගේ මාමා වූ නන්ද මහ තෙරුන් විසින් රජකමට පත්කරන ලද්දේද මහියංගන සෑ බිමෙහි ඇති බෝධිය අබියස දී දුරුතු පොහෝ දිනයකදීය.

බුදු සිරිතේ ඉතා වැදගත් අවස්ථාවක් වන උරුවෙල් දනව් වැසි තුන්බෑ ජටිලයින් දහසක් රහත් බවට පත්කොට ඒ රහතන්වහන්සේ සමග බුදුන්වහන්සේ බිම්සර රජු හමුවීමට රජගහ නුවරට පැමිණියේද, බිම්සර රජු බෞද්ධයෙකු වූයේද, වේළුවනාරාමය පූජා කළේද දුරුතු මාසයකදීය. භික්ෂූන්ට ආරාම පිළිගැනීමට වදාළේද දුරුතු මාසයකදීය.

අන්ධකාරයේ නිමග්නව සිටි ජාතියකට ආලෝකය ලබාදෙනු පිණිස ද, ම්ලේච්ඡත්වයේ විසූ ජාතියක් ශිෂ්ඨත්වයට පත් කරනු පිණිසද වැඩමකර වදාළ බුදුන් වහන්සේගේ උදාරතර ඓතිහාසික ප්‍රථම ලංකා ගමන සිහි පත්කරවන මහියංගන සෑ රදුන් අදත් නව ප්‍රතිසංස්කරණයෙන් යුතුව එහි බැබළේ.

ජාතියේ වංශ කතාවලට මුලාරම්භවුණු ජාතියේ පෞථත්වය දේශයේ උදාරත්වයට මං පෑදුණු බුදු සිරිපා පහස ලබා පුණ්‍ය භූමියක් බවට ලක්දිව පත්වුණු දුරුතු පොහෝදිනය ලක්වැසි බෞද්ධයන්ගේ ආගමික හා ඓතිහාසික දිනයකි.

එදා බුදුන් වහන්සේ නොවැඩි යානම් සිංහලයා තවමත් නොදියුණු ගෝත්‍රයක් වශයෙන් අඳුරේම ජීවත් වන්නට තිබිණ. අවුරුදු දෙහස් පන්සිය හතළිස් ගණනකට අධික කාලයක් මුළුල්ලේ සම්බුද්ධ ශාසනය රැකගත් ජාතියක් වශයෙන් මහත් ගෞරවයෙන් ජාතියේ පෞථ ඉතිහාසය දෙස බලා ප්‍රීතිවන්නටත්, වර්තමානය දෙස බලා සංවේගවන්නටත්, අනාගතය දෙස බලා ස්ථිර අධිෂ්ඨානයක් ඇතිකර ගැන්මටත් මේ වසරේ හොඳම දිනය මෙම දුරුතු පොහෝ දිනයයි.

## ❊ නව සහශ්‍රයට ධර්මානුශාසනා ❊

### හිතොපදේශයෙන්

අර්ත්ථාතුරාණං න ගුරුර් න බන්ධුර්
විද්‍යාතුරාණං න සුඛං න නිද්‍රා
කාමාතුරාණං න භයං න ලජ්ජා
ක්‍ෂුදාතුරාණං න රුචිර් න පත්ථ්‍යා

***අර්ථය :*** *වස්තු රැස්කිරීමෙහි නියුක්ත වූවාහු ගුරුවරුන් හා ඥාතීන් නොලබන්නෝය. විද්‍යාව සොයා යන්නාහු සැපය හා නිද්‍රාව දුරුකරන්නෝය. කාමයෙන් පීඩිත වූවාහු භය හා ලැජ්ජාව නසන්නෝය. ක්‍ෂුධාවෙන් පීඩිත වූවාහු අභිරුචිය හා පථ්‍යය නොබලන්නෝය.*

මිනිසුන්ගේ සාමාන්‍ය ක්‍රියාකාරකම් 4 ක් ගැන මෙම පද්‍යයෙන් විස්තර කර ඇත. ඉන් පළමුවැන්න නම් වස්තු රැස්කිරීමෙහි නිපුන් වූවන් ගුරුවරුන් හා ඥාතීන් නොලබන බවයි. මෙම පද්‍යය රචනා වූ කාලයේ එය එසේ වුවද වත්මන් සමාජය දෙස බලන විට ගුරුවරුන් හා ඥාතීන් පමණක් නොව වස්තු රැස්කිරීමේ යෙදෙන්නන් තම දෙමාපියන් ඇතුළු අඹුදරුවන් පවා අමතක කර දමනු ඇත. මෙලොව ඇති බාහිර සම්පත් සදාකාලික ඒවා නොවේ. අපට ඒවා හැමදා පරිහරණය කළ නොහැකිය. හේතුව අපද සදාකාලික නොවන බැවිනි. එනිසා ජීවිත කාලය පුරාම රැස්කර නොඉඳ ජීවත්වන කාලයට ප්‍රමාණවත් ලෙස භුක්තිවිඳීමට සපයාගැන්ම ඥානාන්විතය. නොඑසේ නම් හැමදාම නොලැබෙන දේ ගැන සිතා දුක්වීමට පසුතැවීමට සිදුවේ. ඒ වගේම, කෙනෙක් අනුන්ගේ දේ බෙදාගැනීමට සිතන්නේ නම් එයින් පෙනෙන්නේ ඔහු ඒ ගැන ගිජුවී ඇති බවයි. අපොහොසත් තම අසල්වැසි ඥාතියා අමතක කර, යොදුන් ගණන් දුර පොහොසත් නෑයා සොයා ඔබ යනු ඇතැයි කියමනක්ද තිබේ. ඒ ගිජුකමේ ස්වභාවයයි. ඒ නිසා ධන තණ්හාවෙන් වෙළුණු පුද්ගලයාට ඥාතීන් ද මිතුරන් ද ගුරුවරු දෙමාපිය අඹුදරුවන් ද නැත.

මෙහි එන දෙවන කාරණය නම් ශිල්ප ශාස්ත්‍ර හදාරන්නන් එමගින් සිය සැපත හා නින්ද දුරුකරගන්නා බවයි. අධික ලෙස මහන්සි වී අධ්‍යාපනාදී කටයුතු කරන් නන්ට තම සුව පහසුව පිළිබඳව මූලිකව සිතන්නට ගිය හොත් තම අභිමතාර්ථය කෙරෙහි යා නොහැකිය. විනෝ දයට බරව අලසව කටයුතු කිරීමෙන් ශාස්ත්‍රීය කටයුතු පම ණක් නොව අනෙක් කටයුතුද අඩාල වනු නොඅනුමානය.

කාමාතුරයන්ගේ හෙවත් කාමයෙහි ලොල් වූවන්ගෙන් ඉවත්ව යන කාරණා දෙකක් ගැන තෙවනුව මෙහි සඳහන් කොට තිබේ. ඒ ලැජ්ජාව හා බයයි. මෙම දෙක ලෝක පාලක ධර්ම දෙක ලෙස ධර්මයේ සඳහන් කරයි. ඒවා නැත්තාට මෙලොව කළ නොහැකි පහත් දෙයක් නැත. ඔහු බිහිසුණු අපරාධ කරන්නට පෙළඹේ. කාමය මුවහතක තැවරූ පැණි මෙනැයි කියති. පැණි දිව පිනවන ඉතා මධුර දෙයක් වුවත් එය කෑම ඉතා පරිස්සමෙන් කළ යුත්තකි. මෙහි ලා වැදගත්වන්නේ කාමයෙහි අන්තගාමී නොවීමයි.

අවසාන කරුණ ලෙස සඳහන් කරන්නේ බඩ සයින් පෙලෙන්නන් විසින් ආහාරයේ ඇති රස හා ගුණාගුණ නොබලා බඩගිනි නිවාගැනීමට ලැබෙන දෑ ආහාරයට ගැනීමයි. ඒ රස හා ගුණ සෙවීමට ගියහොත් බඩගින්න තීව්‍රවන බැවිනි.

එදිනෙදා ජීවිතය අපට කරදර වලින් තොරව ගතකළ නොහැකිය. හොඳම දේ නම් ඒවා ඥාණාන්විතව විසඳා ගැනීමයි. අප ඉගෙනගත යුත්තේ ලොකු ප්‍රශ්නයක් පොඩි එකක් කරගැන්මටත්, පොඩි ප්‍රශ්නයක් නැතිකර ගැනීමටත්ය. අපට අමිහිරි දෙයක් ඇසුනොත් එය යළි යළිත් සිහි නොකළ යුතුවා මෙන්ම මිහිරි යමක් ඇසුනොත් එය යළි යළි සිහිපත් කළ යුතු බවත්ය. වැටීම සාමාන්‍ය දෙයකි. නමුත් ඉන් නැගිටීමට අධිෂ්ඨාන කරගත යුතුය.

ලැබූ නව වසරේ අප හැම සිහියට ගත යුතු කාරණය ද එයයි.



**රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති**
**♦ පූජ්‍ය විල්ඹය විමලජෝති හිමි**
**ලන්ඩන් බෞද්ධ විහාරය**
**The Avenue, Bedford Park,**
**London W4 1UD**

**NORMA & Co**
**Associate Solicitors**
2 Queens Parade
Green Lanes, London N8 0RD
Tel. 020 8348 7772 / 07717173414
Any type of Visa Applications
Car Accidents
***Colombo Office***
Visa Applications & Any Refusals
100/6 Rosemead Place
Colombo 7
Tel. 2672432 / 0777686632